වාර්ෂික කාර්යසාධන වාර්තාව
2021
වැවිලි අමාත්‍යාංශය



වැවිලි අමාත්‍යාංශය

11 වන මහළ , සෙත්සිරිපාය දෙවන අදියර , බත්තරමුල්ල

- දුරකථන **- 011 - 2186160**
- ෆැක්ස් **- 011 - 2186076**
- වෙබ් අඩවිය **- http://www.plantationindustries.gov.lk**

සැලසුම් අංශය

- දුරකථන **- 011 - 2187070** (අධ්‍යක්ෂ ජනරාල්)
- ෆැක්ස් **- 011 - 2187075**
- විද්‍යුත් තැපැල් ලිපිනය **- mpiplanningdiv@gmail.com**

ගරු වැවිලි අමාත්‍යතුමාගේ පණිවිඩය



සෞභාග්‍යයේ දැක්ම රජයේ ප්‍රතිපත්ති ප්‍රකාශයට අනුව යමින් ජාත්‍යන්තර වෙළඳපොළ ජය ගැනීම උදෙසා නූතන තාක්ෂණයෙන් පෝෂිත , ඉහළ අගය එකතු කිරීමක් සහිත වූ වැවිලි භෝග සංවර්ධනය, වගාකරුවන්ගේ ආදායම උසස් මට්ටමකට ගෙන ඒම හා උපයන විදේශ විනිමය ප්‍රමාණය ඉහළ නැංවීම යන මූලික අරමුණු පෙරදැරි කර ගෙන 2021 වර්ෂයේ දී අමාත්‍යාංශයේ කාර්යභාරය ඉටු කිරීමට සැලසුම් කරන ලදී.

ශ්‍රී ලංකාවේ ජාතික ආර්ථික හා සමාජීය සංවර්ධනයේ දී ඉතා වැදගත් අංශයක් වන තේ, රබර් හා පොල් සහ සුළු අපනයන භෝග වගාවන් ද ඒ ආශ්‍රිත නිෂ්පාදන කර්මාන්ත ද ප්‍රවර්ධනය උදෙසා ප්‍රතිපත්තිමය මඟපෙන්වීම හා සංවර්ධන වැඩසටහන් සඳහා අවශ්‍ය මාර්ගෝපදේශකත්වය ලබාදෙමින් අමාත්‍යාංශයට අනුබද්ධ රාජ්‍ය අමාත්‍යාංශ හා ඊට අනුබද්ධ ආයතන සඳහා ප්‍රතිපත්ති හා මඟපෙන්වීම ලබාදෙමින් වැවිලි ක්ෂේත්‍රයේ ඉහළ කාර්යසාධනයක් ලඟා කර ගත හැකි වන පරිදි මෙහෙයවීමට හැකියාව ලැබීම පිළිබඳ ව සතුටු වෙමි.

තිරසර වැවිලි සංවර්ධනයක් වෙත යාමට වැවිලි ප්‍රජාවට නව වැඩසටහන් කිහිපයක් වැවිලි අමාත්‍යාංශය විසින් 2021 වර්ෂයේ දී හඳුන්වා දෙන ලදී. විශේෂයෙන්ම වැවිලි භෝග සඳහා නව තාක්ෂණික ක්‍රම සහ කාලගුණික විපර්යාස හේතුවෙන් ඇතිවන බලපෑම අවම කිරීම සඳහා විසිරි ජල සම්පාදන ක්‍රම හඳුන්වා දීම වැනි වැඩසටහන් මෙම වර්ෂයේ දි ක්‍රියාත්මක කරන ලදී.

ගෝලීය වශයෙන් පැවති කොවිඩ් 19 වසංගත තත්ත්වය හමුවේ වුව ද අපනයන ඉලක්ක කර ගත් භෝග ප්‍රවර්ධනය කිරීම හා අගය එකතු කළ නිෂ්පාදන සඳහා දේශීය හා විදේශීය වෙළඳපොළ අවස්ථා පුළුල් කිරීමට අවශ්‍ය පියවර ගැනීමට හැකි වීමත් සාමූහික ක්‍රියාදාමයකින් ලද ජයග්‍රහණයකි.

මුහුණ දුන් සියලු අභියෝග ජය ගනිමින් වැවිලි ක්ෂේත්‍රය 2020 වර්ෂයේ දී උපයන ලද රු.බි.577ක අපනයන ආදායම 30%කින් ඉහළ නංවා රු.බි.750ක අපනයන ආදායමක් ඉහළට ගෙන ඒම ද 2021 වර්ෂයේ දී අමාත්‍යාංශය ලද තවත් ජයග්‍රහණයකි.

නව තාක්ෂණය මුසු වූ අපනයන කේන්ද්‍රීය වැවිලි කර්මාන්තයක් තුළින් විදේශ වෙළඳපොළ ජයගනිමින් දේශීය ආර්ථිකය නගා සිටුවීම සඳහා වර්ෂය තුළ පැවති විවිධ අභියෝග මධ්‍යයේ වැවිලි ක්ෂේත්‍රයේ මෙම ජයග්‍රහණ අත්කරදීම සඳහා සුවිශේෂී කාර්යභාරයක් ඉටු කළ රාජ්‍ය අමාත්‍යවරුන් තිදෙනාට ද, වැවිලි අමාත්‍යාංශයීය ලේකම්තුමා ඇතුළු වැවිලි අමාත්‍යාංශයේ කාර්ය මණ්ඩලයට ද රාජ්‍ය අමාත්‍යාංශ ලේකම්වරුන් ඇතුළු එම අමාත්‍යාංශයීය කාර්ය මණ්ඩලයට ද, අනුබද්ධ ආයතනවල ප්‍රධානීන්ට හා එම කාර්ය මණ්ඩලවලට ද, වැවිලි ක්ෂේත්‍රය සම්බන්ධ සියලුම පාර්ශ්වකරුවන්ට ද ස්තුතිය පුද කිරීමට මම මෙය අවස්ථාවක් කර ගනිමි.

වෛද්‍ය රමේෂ් පතිරණ (පා.ම.)
වැවිලි අමාත්‍ය

ලේකම්තුමාගේ පණිවිඩය



ජාතික ආර්ථිකයට විදේශ විනිමය උපයනු ලබන ප්‍රධානතම ක්ෂේත්‍රයක් වශයෙන් වැවිලි ක්ෂේත්‍රයෙහි නව ප්‍රබෝධයක් උදෙසා නූතන තාක්ෂණය හඳුනාගැනීමට පර්යේෂණමය දැනුම උකහාගනිමින් සුවිශේෂ ජාත්‍යාන්තර වෙළඳපොළ ජයගැනීම වර්තමාන උපායමාර්ගික යොමුව ලෙස හඳුනාගෙන තිබේ.

සමාලෝචිත වර්ෂය තුළ අමාත්‍යාංශය හා අනුබද්ධ ආයතන විසින් වැවිලි ක්ෂේත්‍රයට අදාළව තමන්ට පැවරී ඇති වගකීම් නොපිරීහෙලා ඉටුකරමින් ක්ෂේත්‍රයේ අභිවෘද්ධිය වෙනුවෙන් කටයුතු කර ඇත. පැවති කොවිඩ් 19 වසංගතය නිසා ඇති වූ අභියෝග හමුවේ වුවද තේ, පොල්, රබර් හා සුළු අපනයන භෝග යන සියළුම අංශවල පසුගිය වර්ෂයට සාපේක්ෂව 2021 වර්ෂයේදී අපනයන ආදායම ඉහළ නංවා ගැනීමට හැකි වී ඇත.

එසේම 2021 වර්ෂයේදී වැවිලි ක්ෂේත්‍රයට කාලගුණික විපර්යාස නිසා ඇති වූ බලපෑම අවම කිරීමටත්, නව තාක්ෂණය හඳුන්වාදීමටත් කටයුතු කිරීම විශේෂිත කාර්යයකි. ඒ අනුව වැවිලි බෝග සඳහා ක්ෂුද්‍ර ජල සම්පාදනය හඳුන්වාදීම සහ දුරස්ථ තාක්ෂණය ඔස්සේ වෙන්දේසි අඛණ්ඩව පවත්වාගැනීම සිදු කරන ලදී.

ගරු වැවිලි අමාත්‍යතුමාගේ සහ ගරු රාජ්‍ය අමාත්‍යතුමන්ලාගේ මඟපෙන්වීම අනුව අමාත්‍යාංශය වෙත පැවරෙන කාර්යභාරයන් ඉටු කිරීම සහ මෙම වර්ෂයට අදාළව වැවිලි ක්ෂේත්‍රයට වෙන් වූ මූල්‍ය ප්‍රතිපාදන ප්‍රශස්ත මට්ටමකට සාර්ථකව උපයෝජනය කිරීමට දායක වූ අමාත්‍යාංශයීය කාර්ය මණ්ඩලයට ද , රාජ්‍ය අමාත්‍යාංශවල කාර්ය මණ්ඩලවලට ද , අනුබද්ධ ආයතනයන්හී ආයතන ප්‍රධානීන් ඇතුළු කාර්ය මණ්ඩලවලට ද මාගේ කෘතඥතාවය පිරිනමමි.

රටේ සෞභාග්‍ය උදෙසා මෙම මෙහෙවර ඉදිරියට ගෙන යමින් වැවිලි ක්ෂේත්‍රයේ නවීකරණය , සහන සැලසීම සහ අගයදාම සංවර්ධනය තුළින් නිෂ්පාදනය සහ අපනයන වෙළඳපොළ ජයගැනීමටත්, අභියෝග හමුවේ නොසැලෙන අදිටනින් සවිමත්ව කටයුතු කිරීමටත් අවශ්‍ය ශක්තිය හා ධෛර්යය ලැබේවායි ප්‍රාර්ථනය කිරීමට ද මෙය අවස්ථාවක් කොට ගනිමි.

රවීන්ද්‍ර හේවාවිතාරණ
ලේකම්

2021 වර්ෂය සඳහා වාර්ෂික කාර්යසාධන වාර්තාව

වැවිලි අමාත්‍යාංශය

වැය ශීර්ෂ අංක 135

01 පරිච්ඡේදය
- ආයතනික පැතිකඩ / ක්‍රියාවට නැංවීමේ සාරාංශය

02 පරිච්ඡේදය
- ප්‍රගතිය හා ඉදිරි දැක්ම

03 පරිච්ඡේදය
- වසරේ සමස්ත මූල්‍ය කාර්යසාධනය

04 පරිච්ඡේදය
- කාර්යසාධන දර්ශක

05 පරිච්ඡේදය
- තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්යසාධනය

06 පරිච්ඡේදය
- මානව සම්පත් පැතිකඩ

07 පරිච්ඡේදය
- අනුකූලතා වාර්තාව

01. පරිච්ඡේදය - ආයතනික පැතිකඩ

1.1 හැඳින්වීම

“වැවිලි කර්මාන්තයේ සංවර්ධනය මඟින් ජාතික සෞභාග්‍යය උදා කිරීමේ” දැක්ම පෙරදැරි කරගෙන අමාත්‍යාංශයීය විෂය පථයට අදාළ කාර්යභාරය ඉටුකරනු ලබන අතරතුර කොවිඩ් 19 වසංගත තත්ත්වය 2021 වර්ෂය පුරාද පැවතීම හේතුවෙන් විවිධ අභියෝගයන්ට මුහුණ දීමට ද සිදුවිය. එසේ අභියෝග මැද වුව ද වැවිලි ක්ෂේත්‍රය අඛණ්ඩව පවත්වාගෙන යමින් ඉහළ කාර්යසාධනයක් ලබාගැනීමට හැකිවීමත් සතුටට කරුණකි.

“සෞභාග්‍යයේ දැක්ම” ප්‍රතිපත්ති ප්‍රකාශයට අනුකූලව සහ රජයේ අනිකුත් ප්‍රතිපත්තීන් මත පිහිටා අමාත්‍යාංශයීය විෂය පථයට අනුකූලව හා අමාත්‍යාංශයට පැවරුණු සුවිශේෂී ප්‍රමුඛතා ඉටුකරලීමේ අරමුණ පෙරදැරි කරගෙන නව තාක්ෂණය මුසුවූ අපනයන කේන්ද්‍රීය වැවිලි කර්මාන්තයක් ඇතිකිරීම සඳහා අවශ්‍ය ප්‍රතිපත්තිමය තීරණ වර්ෂය පුරා අවස්ථානුකූලව ගනු ලැබීය.

එසේම, පැවති කොවිඩ් වසංගත තත්ත්වයේ වුවද අයවැය ලේඛනය මඟින් වැවිලි ක්ෂේත්‍රයේ සංවර්ධනය සඳහා වෙන් කරනු ලැබූ ප්‍රාග්ධන හා පුනරාවර්තන ප්‍රතිපාදනයට සාපේක්ෂව මූල්‍ය කළමනාකරණ ඉලක්ක කරා ලඟාවීමටත් ඒ පිළිබඳ සෑහීමකට ලක්විය හැකි ප්‍රගතියක් අත්කර ගැනීමටත් හැකිවිය.

මීට අමතරව 2021 වර්ෂයේදී රසායනික පොහොර ආනයනය අත්හිටුවා වගාව සඳහා කාබනික පොහොර ප්‍රවර්ධනය කිරීමේ රජයේ ප්‍රතිපත්තිමය තීරණය අනුව කෘෂිකර්ම ක්ෂේත්‍රයේ මතුවූ ව්‍යාකූල තත්ත්වය වැවිලි ක්ෂේත්‍රය තුළ අවම මට්ටමක් දක්වා කළමනාකරණය කිරීමට හැකිවීම අමාත්‍යාංශය ලද ජයග්‍රහණයකි.

ඒ අනුව මෙම සියලු සාධක ද සැලකිල්ලට ගනිමින් වැවිලි අමාත්‍යාංශය හා අනුබද්ධ ආයතන ද, රාජ්‍ය අමාත්‍යාංශ හා ඒ යටතේ ඇති අනුබද්ධ ආයතන සඳහා ද නිසි මඟපෙන්වීම ලබාදීමෙන් හා වැවිලි ක්ෂේත්‍රයේ පාර්ශවකරුවන් සම්බන්ධීකරණය කරමින් වර්ෂ 2021 සඳහා අත්කර ගත් කාර්යසාධනය මෙම වාර්තාවෙන් ඉදිරිපත් කර ඇත.

1.2 දැක්ම, මෙහෙවර, අරමුණු

දැක්ම

"වැවිලි කර්මාන්තයේ සංවර්ධනය මඟින් ජාතික සෞභාග්‍යය උදා කිරීම"

මෙහෙවර

"ආර්ථික, සමාජයීය හා පාරිසරික වශයෙන් තහවුරු වූ වැවිලි කර්මාන්තයේ ඵලදායීතාව, ලාභදායීතාව සහ තිරසාරත්වය ඉහළ නැංවීම "



අරමුණු

සුවිශේෂී ජාත්‍යන්තර වෙළඳපොළ ඛණ්ඩ ජයගැනීම උදෙසා නූතන තාක්ෂණයෙන් පෝෂිත, ඉහළ අගය එකතු කිරීමක් සහිතව වැවිලි භෝග සංවර්ධනය.

වගාකරුවාගේ ආදායම උසස් මට්ටමකට ගෙන ඒම

රටට උපයන විදේශ විනිමය ප්‍රමාණය ඉහළ නැංවීම

අමාත්‍යාංශයීය විෂය පථය

වර්ෂ 2020 ඔක්තෝබර් 06 දිනැති අංක 2196/27 දරණ ගැසට් පත්‍රයට අනුව
(වර්ෂ 2020 සැප්තැම්බර් 25 දිනැති අංක 2194 / 74 හි සංශෝධනය)

පර්යේෂණාත්මක විධි ක්‍රමයන්, නව තාක්ෂණික මෙවලම් හා ප්‍රශස්ත භූමිය උපයෝජනය හරහා අගය එකතු කරන ලද නිෂ්පාදන විවිධාංගීකරණයක් තුළින් අපනයන වෙළඳපොළ ආකර්ෂණය කර ගැනීම ඉලක්ක කර ගනිමින් සමස්ත වැවිලි ක්ෂේත්‍රය නව මානයක් වෙත යොමු කිරීම.

1.3 ප්‍රධාන කාර්යයන්

වර්ෂ 2020 ඔක්තෝබර් 06 දිනැති අංක 2196/27 දරණ ගැසට් පත්‍රයට අනුව

(වර්ෂ 2020 සැප්තැම්බර් 25 දිනැති අංක 2194 / 74 හි සංශෝධනය)

අමාත්‍යාංශයට පැවරුනු සුවිශේෂී ප්‍රමුඛතා

- තේ රබර් සහ පොල් වගා කර ඇති ඉඩම් කැබලි කර ජනාවාස බවට පත් කිරීම සම්පූර්ණයෙන්ම තහනම් කිරීම හා එම ඉඩම් උපරිම ලෙස වැවිලි හා අතුරු භෝග වගා සංවර්ධනය සඳහා යොදා ගැනීම.
- රාජ්‍ය හා පෞද්ගලික යන දෙඅංශයේම සහයෝගීත්වයෙන් Ceylon Tea සඳහා තේ වෙළඳපොළ පුළුල් කිරීම.
- නව තාක්ෂණය හඳුන්වාදෙමින් තේ කර්මාන්තයේ සංවර්ධනය සඳහා අවශ්‍ය දායකත්වයක් සැපයිය හැකි ආකාරයට තේ පර්යේෂණ ආයතනය ප්‍රතිසංවිධානය කිරීම.
- මහා පරිමාණ තේ තොග අපනයනය වෙනුවට වටිනාකම් එකතු කළ ආකාරයෙන් තේ අපනයනය දිරිමත් කිරීම.
- රාජ්‍ය හා පෞද්ගලික වැවිලි සමාගම් සතු ඉඩම් උපරිම ලෙස වගා විවිධාංගීකරණයට ලක් කිරීම හා ආශ්‍රිත කර්මාන්ත දියුණු කිරීම.
- දේශීය පිරිසිදු තේ ශ්‍රී ලංකාවේ අනර්ඝතම නිෂ්පාදනයක් ලෙස ජාත්‍යන්තර වෙළඳපොළ තුළ ප්‍රවර්ධනය කිරීම.

1.4 සංවිධාන සටහන



1.5 අමාත්‍යාංශය යටතේ පවතින අංශ



1.6 අමාත්‍යාංශයට අනුබද්ධ රාජ්‍ය අමාත්‍යාංශ සහ ආයතන

වර්ෂ 2020 සැප්තැම්බර් 25 දිනැති අංක 2194/74 දරණ ගැසට් පත්‍රයට අනුව



වර්ෂ 2020 ඔක්තෝබර් 06 දිනැති අංක 2196/27 දරණ ගැසට් පත්‍රයට අනුව
(වර්ෂ 2020 සැප්තැම්බර් 25 දිනැති අංක 2194 / 74 හි සංශෝධනයට අනුව)



* භාණ්ඩාගාර ප්‍රතිපාදන ලබන ආයතන

1.7 විදේශ ආධාර මත ක්‍රියාත්මක ව්‍යාපෘති

❖ 2021 වර්ෂය තුළ විදේශ ආධාර මත ක්‍රියාත්මක ව්‍යාපෘති කිසිවක් වැවිලි අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක නොවීය.

- **කුඩා තේ හා රබර් වතු පුනර්ජීවන ව්‍යාපෘතිය (STaRR)**
  (සමාගම් වතු ප්‍රතිසංස්කරණ, තේ හා රබර් වතු ආශ්‍රිත බෝග වගා හා කර්මාන්තශාලා නවීකරණ හා තේ හා රබර් අපනයන ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වේ.)

- **කෘෂිකර්ම නවීකරණ ව්‍යපෘතිය**
  (උක්, බඩඉරිඟු, කජු, ගම්මිරිස්, කුරුඳු, කරාබුනැටි, බුලත් ඇතුළු කුඩා වැවිලි බෝග වගා සංවර්ධනය ආශ්‍රිත කර්මාන්ත හා අපනයන ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වේ.)

02. පරිච්ඡේදය - ප්‍රගතිය හා ඉදිරි දැක්ම

නව තාක්ෂණය මුසුවූ අපනයන කේන්ද්‍රීය වැවිලි කර්මාන්තයක්

සෞභාග්‍යයේ දැක්ම ප්‍රතිපත්ති ප්‍රකාශයට අනුකූලව සහ රජය මඟින් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත වෙනත් ජාතික ප්‍රතිපත්තීන් මත පිහිටා "නව තාක්ෂණය මුසුවූ අපනයන කේන්ද්‍රීය වැවිලි කර්මාන්තයක්" ඇති කිරීම සඳහා අදාළ රාජ්‍ය අමාත්‍යාංශ සඳහා ප්‍රතිපත්තිමය මඟපෙන්වීම සිදුකිරීම සහ නියමිත නීති සහ අණපනත්වලට අනුකූලව වැවිලි කර්මාන්ත විෂයයට අදාළ ප්‍රතිපත්ති සම්පාදනය, ජාතික අයවැය, රාජ්‍ය ආයෝජන හා ජාතික සංවර්ධන වැඩපිළිවෙල යටතේ ඇති ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම ප්‍රමුඛ කොටගෙන පහත සඳහන් ඉලක්ක ලඟාකර ගැනීමට අපේක්ෂිතය.

වැවිලි ක්ෂේත්‍රයේ අපනයන ආදායම් ඉලක්ක

2020	2021	2022	2023	2024	2025
•රු.බි.577	•රු.බි.750	•රු.බි.911	•රු.බි.1,040	•රු.බි.1,140	•රු.බි.1,295



භෝග අනුව අපනයන ආදායම් ඉපැයීම්

වැවිලි භෝගය	සත්‍ය (රු.බිලි.)		ඉලක්ක (රු.බිලි.)			
	2020	**2021**	**2022**	**2023**	**2024**	**2025**
තේ	230.17	263.35	332.00	378.00	401.00	439.00
රබර්	151.08	217.35	240.00	288.00	345.00	414.00
පොල්	122.51	166.03	224.00	247.00	271.00	300.00
කිතුල්	0.19	0.21	0.30	0.35	0.43	0.50
තල්	0.021	0.059	0.032	0.034	0.037	0.04
කජු	0.08	0.09	0.64	0.70	0.77	0.85
සුළු අපනයන භෝග	73.00	102.94	113.87	125.53	121.31	139.67
මුළු එකතුව	**577.141**	**750.029**	**910.842**	**1,039.61**	**1,139.55**	**1,294.06**

තේ ක්ෂේත්‍රය

“ශ්‍රී ලංකා” නාමය කාලයක පුරා ජාත්‍යන්තර වෙළඳපොළේ ඉහළින් තබන ලද්දේ තේ, පොල්, රබර් කේන්ද්‍ර කරගත් අපනයන භෝගයන්ය. එම අවකාශය අනාගතයේදීත් පවත්වා ගැනීම සඳහා ගෝලීය වෙළඳපොළට ගැලපෙන ආකාරයට සහ වෙළඳපොළේ ස්ථාවරත්වයක් සහතික කරගැනීමට නව තාක්ෂණය මුසුවූ සහ වටිනාකම් එකතු කළ නිෂ්පාදන වෙළඳපොළට ඉදිරිපත් කිරීමට අපේක්ෂිතය. වැවිලි ක්ෂේත්‍රයේ නිශ්චය කළ ඉලක්ක රාජ්‍ය අමාත්‍යාංශ සමඟ ඒකාබද්ධව අත්පත් කරගැනීමටත් වැවිලි අමාත්‍යාංශය මඟින් කටයුතු කරමින් පවතී.

තේ අංශයේ සමස්ථ කාර්යසාධනය

තේ නිෂ්පාදනය 2020 වර්ෂයට සාපේක්ෂව 2021 වර්ෂයේදී 7.4% කින් ඉහළ ගොස් ඇති අතර තේ අපනයන ප්‍රමාණයද 2020ට සාපේක්ෂව 2021 වර්ෂයේදී 7.6% කින් ඉහළ ගොස් ඇත. එසේම තේ අපනයන ආදායම ද 2020 වර්ෂයට සාපේක්ෂව 14.4% කින් ඉහළ ගොස් ඇත. නමුත් කොළඹ තේ වෙන්දේසියේ තේ කිලෝග්‍රෑමයක සාමාන්‍ය අලෙවි මිල 2020 වර්ෂයට සාපේක්ෂව 2021 වර්ෂයේදී 2% කින් පහළ ගොස් ඇති අතර නැවිගත කිරීම තෙක් වියදම 2020 වර්ෂයට සාපේක්ෂව 2021 වර්ෂයේදී 6.3% කින් ඉහළ ගොස් ඇත.

තේ නිෂ්පාදනය

විස්තරය	වර්ෂ 2020 (සත්‍ය)	වර්ෂ 2021 (සත්‍ය)	ඉලක්ක		
			2022	2023	2024
තේ නිෂ්පාදනය (කි.ග්‍රෑ.මිලි.)	278.85	299.48	315.00	330.00	345.00
අපනයන ආදායම (රු.බිලි.)	230.16	263.35	303.00	339.00	365.00
අපනයන ප්‍රමාණය (කි.ග්‍රෑ.මිලි)	265.56	285.87	300.00	320.00	328.00
කොළඹ තේ වෙන්දේසියේ තේ කිලෝග්‍රෑමයක සාමාන්‍ය අලෙවි මිල(රු.)	628.21	615.44	658.00	734.00	830.00
නැවගත කිරීම තෙක් වියදම (කි.ග්‍රෑ./රු.)	866.70	921.23	1,010.00	1,060.00	1,112.00

මූලාශ්‍රය : ශ්‍රී ලංකා තේ මණ්ඩලය

උන්නතාංශ අනුව තේ නිෂ්පාදනය

විස්තරය	2020 (කි.ග්‍රෑ.මිලි.)	2021 (කි.ග්‍රෑ.මිලි.)	වෙනස (කි.ග්‍රෑ.මිලි.)
උඩරට තේ	62.24	65.33	3.09
මැදරට තේ	46.73	50.98	4.25
පහතරට තේ	169.88	183.18	13.30
මුළු එකතුව	**278.85**	**299.49**	**20.64**

උන්නතාංශය අනුව සලකා බැලීමේදී 2021 වර්ෂයේ සමස්ථ තේ නිෂ්පාදනයෙන් උඩරට තේ නිෂ්පාදනය 21.8%ක් ලෙස ද, මැදරට තේ නිෂ්පාදනය 17.0%ක් ලෙස ද, පහත රට තේ නිෂ්පාදනය 61.1%ක් ලෙස ද වාර්තා කරයි.

මෙය 2020 වර්ෂයේදී පිළිවෙලින් 22.3%, 16.7%, 60.9%ක් ලෙස විය. ප්‍රධාන තේ නිෂ්පාදන ක්‍රමවේදනයන් අනුව සලකා බැලීමේදී 2021 වර්ෂයේදී සාම්ප්‍රදායික තේ නිෂ්පාදන ප්‍රමාණය 90.3%ක මට්ටමක පවති.





ප්‍රධාන තේ නිෂ්පාදන ක්‍රමවේදයන් අනුව තේ නිෂ්පාදනය

විස්තරය	වර්ෂ 2020 (කි.ග්‍රෑ.මිලි.)	වර්ෂ 2021 (කි.ග්‍රෑ.මිලි.)	වෙනස (කි.ග්‍රෑ.මිලි.)
සාම්ප්‍රදායික තේ	252.72	270.73	18.01
සී.ටී.සී. තේ	24.10	26.19	2.09
හරිත තේ	2.03	2.57	0.54
මුළු එකතුව	**278.85**	**299.49**	**20.64**





තේ අලෙවි මිල

කොළඹ තේ වෙන්දේසි දත්ත අනුව 2020 වර්ෂයට සාපේක්ෂව 2021 වසරේ අලෙවි කරන ලද තේ ප්‍රමාණය 10.3% කින් ඉහළ ගොස් ඇති නමුත් තේ කිලෝ ග්‍රෑමයක සමාන්‍ය අලෙවි මිල 2% කින් පහළ ගොස් තිබුණි.

තේ වෙළඳපොළ දත්ත

විස්තරය	වර්ෂ 2020	වර්ෂ 2021	වෙනස	
			ප්‍රමාණය	(%)
අලෙවි කරන ලද මුළු තේ ප්‍රමාණය (කි.ග්‍රෑ.මි)	268.23	295.78	27.60	10.3
තේ කිලෝග්‍රෑමයක සාමාන්‍ය අලෙවි මිල (රු.)	628.21	615.44	(12.77)	(2.0)

මූලාශ්‍රය : ශ්‍රී ලංකා තේ මණ්ඩලය

මාසික තේ වෙන්දේසි සමාන්‍ය මිලෙහි හැසිරීම



ලොව ප්‍රධාන තේ අලෙවි මධ්‍යස්ථානයන්හි අලෙවි ප්‍රමාණය

මධ්‍යස්ථානය	2020		2021		වෙනස	
	ප්‍රමාණය (මෙ.ටො.)	සමාන්‍ය මිල කි.ග්‍රෑ 1කට (ඇ.ඩො.)	ප්‍රමාණය (මෙ.ටො.)	සමාන්‍ය මිල කි.ග්‍රෑ 1කට (ඇ.ඩො.)	ප්‍රමාණය (මෙ.ටො.)	සමාන්‍ය මිල කි.ග්‍රෑ 1කට (ඇ.ඩො.)
කල්කටා	132,598	2.89	169,338	2.86	36,740	(0.04)
කෝචින්	41,520	1.91	47,890	1.92	6,370	(0.01)
චිතගෝන්	82,986	2.05	88,129	2.32	5,143	0.27
මොම්බාසා	516,803	1.93	503,893	1.97	(12,910)	0.04
ජකර්තා	-	-	-	-	-	-
කොළඹ	**268,236**	**3.39**	**295,790**	**3.09**	**27,553**	**(0.29)**
ගුවාර්ති	162,520	2.67	154,898	2.49	(7,622)	(0.18)
මලාවි	5,997	1.44	12,980	1.38	6,983	(0.07)
එකතුව	**1,205,978**	**2.46**	**1,267,610**	**2.43**	**61,632**	**(0.03)**

මූලාශ්‍රය : ශ්‍රී ලංකා තේ මණ්ඩලය





තේ අපනයනය

2021 වර්ෂයේ සමස්ත තේ අපනයන හා ප්‍රතිඅපනයන ප්‍රමාණය කි.ග්‍රෑ.මිලි 285.87කි. එයින් 97%ක ප්‍රමාණයක්ම එනම් කි.ග්‍රෑ.මිලි 276 ක්ම රට තුල තේ නිෂ්පාදනයේ අපනයන වේ. 2020 වර්ෂයට සාපේක්ෂව 2021 වසරේ තේ අපනයනය 98%කින්ද ප්‍රතිඅපනයන ප්‍රමාණය 10%කින්ද ඉහළ ගොස් ඇත. එසේම, අපගේ තේ අපනයනය වන ප්‍රධාන රටවල් 20 අතරින් 2021 වසර තුළ රටවල් 13කටම සිදු කළ අපනයන ප්‍රමාණය 2020 වසරට සාපේක්ෂව ඉහළ ගොස් ඇත. එයින් 20%ට වැඩි ප්‍රතිශතයකින් ඉරාකය, එක්සත් අරාබි එමීර් රාජ්‍යය, ලිබියාව හා බෙල්ජියම වැනි රටවලට වූ අපනයනය ඉහළ ගොස් ඇත.

ශ්‍රී ලංකා තේ අපනයන හා ප්‍රතිඅපනයන දත්ත

වර්ගය	සාම්ප්‍රදායික කළු තේ		හරිත තේ		ක්ෂණික තේ		එකතුව	
	ප්‍රමාණය (කි.ග්‍රෑ.මී)	කි. ග්‍රෑ / නැ.වි.ස මිල (රු.)	ප්‍රමාණය (කි.ග්‍රෑ.මී)	කි. ග්‍රෑ / නැ.වි.ස මිල(රු.)	ප්‍රමාණය (කි.ග්‍රෑ.මී)	කි. ග්‍රෑ / නැ.වි.ස මිල (රු.)	ප්‍රමාණය (කි.ග්‍රෑ.මී)	කි. ග්‍රෑ / නැ.වි.ස මිල (රු.)
2020								
අපනයන	251.77	836.54	1.98	2,067.42	2.81	1,446.88	256.57	852.76
ප්‍රති අපනයන	6.82	1,032.90	2.13	2,003.15	0.03	1,240.21	8.99	1,264.44
එකතුව	**258.59**	**841.72**	**4.11**	**2,034.10**	**2.84**	**1,444.50**	**265.56**	**866.70**
2021								
අපනයන	270.76	882.20	2.27	2231.11	2.97	1740.31	276.0	902.54
ප්‍රති අපනයන	7.48	1182.77	2.33	2285.22	0.06	1358.94	9.87	1443.77
එකතුව	**278.24**	**890.29**	**4.60**	**2258.48**	**3.03**	**1732.54**	**285.87**	**921.23**

මූලාශ්‍රය : ශ්‍රී ලංකා තේ මණ්ඩලය

ශ්‍රී ලංකාව තේ අපනයනය කරනු ලබන ප්‍රධාන රටවල්

ප්‍රධාන රටවල්	2020		2021		අඩුවීම/වැඩිවීම	
	ප්‍රමාණය (කි.ග්‍රෑ.)	මුළු අපනයනයෙන් (%)	ප්‍රමාණය (කි.ග්‍රෑ.)	මුළු අපනයනයෙන් (%)	ප්‍රමාණය (කි.ග්‍රෑ.)	ප්‍රතිශතය
ඉරාකය	33,377,320.18	12.57	42,455,311.76	14.85	9,077,992	27
තුර්කිය	38,866,312.05	14.64	29,745,683.97	10.41	(9,120,628)	(23)
රුසියාව	29,608,372.75	11.15	27,357,322.09	9.57	(2,251,051)	(8)
එ.අරාබි එමිර් රාජ්‍යය	8,670,345.96	3.26	23,147,841.68	8.10	14,477,496	167
ඉරානය	15,127,066.61	5.70	15,833,587.62	5.54	706,521	5
චීනය	14,123,417.52	5.32	14,221,526.33	4.97	98,109	1
ලිබියාව	7,806,247.00	2.94	12,338,990.90	4.32	4,532,744	58
අසර්බයිජානය	10,303,102.37	3.88	10,591,095.70	3.70	287,993	3
චිලී	9,419,054.71	3.55	8,834,918.87	3.09	(584,136)	(6)
සිරියාව	9,536,804.46	3.59	7,767,178.60	2.72	(1,769,626)	(19)
ජපානය	5,611,524.88	2.11	6,595,486.62	2.31	983,962	18
සෞදි අරාබිය	6,804,226.65	2.56	6,530,942.90	2.28	(273,284)	(4)
ජර්මනිය	6,431,148.31	2.42	6,402,796.41	2.24	(28,352)	(0)
ඇමරිකා එක්සත් ජනපදය	5,707,342.77	2.15	5,973,744.31	2.09	266,402	5
ජෝර්දානය	4,680,080.88	1.76	5,218,337.13	1.83	538,256	12
තායිවානය	4,504,033.71	1.70	4,887,721.75	1.71	383,688	9
හොංකොං	3,762,717.12	1.42	4,440,574.08	1.55	677,857	18
යුක්‍රේනය	4,556,734.39	1.72	4,276,529.60	1.50	(280,205)	(6)
බෙල්ජියම	2,237,942.83	0.84	3,532,531.93	1.24	1,294,589	58
පෝලන්තය	2,978,301.95	1.12	3,349,409.62	1.17	371,108	12

මූලාශ්‍රය : ශ්‍රී ලංකා තේ මණ්ඩලය

කොවිඩ් 19 හේතුවෙන් රට වසා තිබූ කාලය තුළ වැවිලි ක්ෂේත්‍රයේ උන්නතිය උදෙසා සිදුකළ විශේෂ ක්‍රියාකාරකම්

තේ ක්ෂේත්‍රය

- කොවිඩ් අවධානම හමුවේ ඇඳිරි නීතිය පනවා ඇති සහ රට වසා තිබූ කාලසීමාව තුළ තේ කර්මාන්තශාලා පවත්වාගෙන යාමේ දුෂ්කරතාවන්ට මුහුණ දුන් අතරම වැවිලි ක්ෂේත්‍රයේ රැකියාවල නිරත ප්‍රජාව ද දැඩි අපහසුතාවලට මුහුණ දුනි.

  එම තත්ත්වය පාලනය කරමින් වැවිලි ක්ෂේත්‍රයේ ග්‍රාමීය ප්‍රජාවගේ ජන ජීවිතය යථා පරිදි පවත්වාගෙන යාමටත්, ජාතික ආර්ථිකය ශක්තිමත්ව පවත්වාගෙන යාමටත් පොලීසිය, සෞඛ්‍ය අංශවල මහපෙන්වීම යටතේ කටයුතු කරන ලෙස දැනුවත් කිරීම සඳහා අමාත්‍යාංශය මඟින් 2021.05.11, 2021.05.21 සහ 2021.08.21 දිනයන්හිදි අදාළ සියළුම රාජ්‍ය ආයතන වෙත ලිපි නිකුත් කරන ලදී. එහි ප්‍රතිඵලයක් වශයෙන් ඇඳිරි නීතිය පනවා ඇති සහ සංචරණ සීමා පනවා ඇති කාලසීමාව තුළ කුඩා තේ වතු හිමියන්, දළු සැපයුම්කරුවන්, දළු ප්‍රවාහනකරුවන්, කර්මාන්තශාලා හිමියන් සහ අපනයනකරුවන්ට ඔවුන්ගේ දායකත්වය බාධාවකින් තොරව තේ ක්ෂේත්‍රයට ලබා දීමට හැකි විය.

- සෞඛ්‍ය බලධාරීන්ගේ උපදෙස් පරිදි 2020 වසරේ සිට මාර්ගගත තාක්ෂණය ඔස්සේ පැවැත්වීමට කටයුතු කරන ලද කොළඹ තේ වෙන්දේසිය ඒ ආකාරයෙන්ම පවත්වාගෙන යාමට අවශ්‍ය පහසුකම් සලසන ලදී.

- ක්ෂේත්‍ර පරීක්ෂණ සිදු කිරීමේදී සෞඛ්‍ය බලධාරීන්ගේ උපදෙස් සහ නියාමනයන්ට යටත්ව තේ පරීක්ෂක නිලධාරීන් විසින් ක්ෂේත්‍ර අදාළ මෙහෙයුම් කටයුතු කරනු ලැබීය.

රබර් ක්ෂේත්‍රය

- 2021 වර්ෂයේ කොවිඩ් 19 වසංගත රෝගය පැතිරීම පාලනය සඳහා රජය විසින් ගෙන තිබූ අන්තර් පළාත් සංචරණ සීමාවන් යටතේ වුව ද, රබර් නිෂ්පාදන කර්මාන්ත ක්ෂේත්‍රයේ සැපයුම් ජාලයන් අඛණ්ඩව පවත්වා ගෙන යාම උදෙසා පළාත් සංචරණ බලපත්‍ර ලබා ගැනීමට අමාත්‍යාංශය මට්ටමින් රබර් නිෂ්පාදන ආයතන වෙත අවශ්‍ය සහය ලබා දෙන ලදි.

පොල් ක්ෂේත්‍රය

- පොල් ක්ෂේත්‍රයේ සියලුම අනුබද්ධ ආයතන සහභාගී කරගනිමින් Zoom තාක්ෂණය ඔස්සේ රැස්වීම් සංවිධානය කරමින් ඒ තුළින් පොල් ක්ෂේත්‍රයේ අවස්ථානුකූලව පැනනැගුණු ගැටළු සහ විසඳුම් ලබාගැනීමට ක්‍රියා කරන ලදි.

- සෞඛ්‍ය අමාත්‍යාංශය සහ ප්‍රාදේශීය සෞඛ්‍ය නිලධාරීන්ගේ මාර්ගෝපදේශනයන්ට යටත්ව හා ඊට අනුකූලව පොල් ක්ෂේත්‍රයේ ක්‍රියාකාරකම් අඛණ්ඩව පවත්වාගෙන යාමට අවශ්‍ය මහපෙන්වීම ලබදෙන ලදි.

2021 වර්ෂයේ වැවිලි ක්ෂේත්‍රය වෙනුවෙන් ක්‍රියාත්මක කළ විශේෂ ක්‍රියාකාරකම්

තේ ක්ෂේත්‍රය

- වැවිලි අමාත්‍යාංශයේ මූලිකත්වයෙන් පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ කෘෂිකර්ම පීඨයේ විද්වත් කණ්ඩායමක් විසින් සකස් කරන ලද 2021 - 2025 උපායමාර්ගික සැලැස්මෙහි 2021 වර්ෂයට අදාළ ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය කටයුතු සිදුකිරීම.

- අමාත්‍යාංශයේ අධීක්ෂණය යටතේ ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ ප්‍රතිපාදන මත ක්‍රියාත්මක කරන ලද පහත ව්‍යාපෘති සඳහා අවශ්‍ය ප්‍රතිපත්තිමය සහ මෙහෙයුම් සහය ලබා දෙන ලදි.

    - ✓ මධ්‍ය පරිමාණ තේ වතු (අක්කර 10-50) සඳහා ක්‍රියාත්මක කරන ලද ආදර්ශ තේ වගා ව්‍යාපෘතිය යටතේ අදියර වශයෙන් ඉඩම් හිමියන් 17 දෙනෙකු සඳහා රු.මි.2.3ක් ලබා දෙන ලදි.
    - ✓ ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ අධීක්ෂණයෙන් කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය විසින් ක්‍රියාත්මක කරනු ලබන තේ තවාන් 500 ව්‍යාපෘතිය සඳහා රු. මිලියන 125 ක් ද ලබා දී ඇත.
    - ✓ ශ්‍රී ලංකා තේ මණ්ඩලය ක්‍රියාත්මක කළ තේ තවාන් 138 ව්‍යාපෘතිය මගින් 2021 වර්ෂයේ දෙසැම්බර් 31 දක්වා රු.මි.55.78ක් ලබා දී ඇත. තවාන් 113ක කටයුතු ආරම්භ කර ඇති අතර , තවාන් 102 ක පැළ සිටුවා ඇත.

- ✓ සියලුම තේ පරීක්ෂක කලාප ආවරණය වන පරිදි සහනාධාර ක්‍රමයක් සහිත ආදර්ශ කාබනික / ජෛව පොහොර නිෂ්පාදනය කරන ඒකක ඇති කිරීමේ ව්‍යාපෘතිය යටතේ තේ ආදර්ශ 80 ක් ස්ථාපිත කිරීමට නියමිත වූ අතර වසර අවසාන වන විට ආදර්ශ 92 ක් ස්ථාපිත කර ඇත. මේ සඳහා රුපියල් මිලියන 40 ක මුදලක් (නිෂ්පාදන ඒකක එකක් සඳහා සහනාධාර මුදල රු. 500,000/ =) වෙන් කරන ලද අතර 2021.12.31 දිනට රු.මි.8.78ක් නිදහස් කර ඇත.

- තේ කම්හල් නවීකරණ සහනාධාර යෝජනා ක්‍රමය වෙතින් 2021 වසර සඳහා රුපියල් මිලියන 20ක් වැය කරමින් කර්මාන්ත ශාලා 42ක් ආවරණය කර ඇත.

- තේ හෙක්ටයාර 263ක් ආවරණය වන පරිදි තේ නැවත වගා කිරීමේ සහනාධාරය සඳහා රුපියල් මිලියන 80ක සහනාධාර මුදලක් ගෙවන ලදී.

- ආසියානු සංවර්ධන බැංකු ණය යෝජනා ක්‍රමය යටතේ කුඩා හා මධ්‍ය පරිමාණ තේ වතු හිමියන්ගේ කෙටි හා දිගුකාලීන මූල්‍ය අවශ්‍යතා සපුරාලීම සඳහා මුදල් අමාත්‍යාංශයේ සහ වැවිලි අමාත්‍යාංශයේ පූර්ණ අධීක්ෂණය යටතේ සුදුසුකම් ලත් සහභාගීත්ව මූල්‍ය ආයතන (PFI) 10 ක සහයෝගීතාවයෙන් තේ නැවත වගාව, නව වගාව, පාළු සිටුවීම, පැළ තවාන් සංවර්ධනය, වාරි, ජල හා පාංශු කළමනාකරණය සහ යාන්ත්‍රීකරණය වැනි කෘෂිකාර්මික භාවිතයන් තුළින් තේ දළු නිෂ්පාදනය ඉහළ නැංවීමේ සියළුම ආකාරයේ ව්‍යාපෘති සඳහා ණය ලබා දීමට ණය යෝජනා ක්‍රමයක් ක්‍රියාත්මකයි.
  මේ යටතේ වසර අවසාන වන විට රු. මිලියන 797 ක ණය ලබා ගැනීම සඳහා ණය අයදුම්පත් ඉදිරිපත් වී ඇති අතර ප්‍රතිලාභී කුඩා තේ වතු හිමියන් 330 ක් සඳහා නිකුත් කරන ලද ණය ප්‍රමාණය රු.මිලියන 550.793කි.

- තේ වගාව සඳහා නව තාක්ෂණික ක්‍රම හඳුන්වාදීම හා කාලගුණික විපර්යාස හේතුවෙන් ඇතිවන බලපෑම අවම කිරීම සම්බන්ධයෙන් දැනුවත් කිරීම සඳහා පුහුණුකරුවන් පුහුණුකිරීමේ වැඩසටහන් පවත්වන ලදී.

  ‘‘දේශගුණ සුහුරු තේ වගා තාක්ෂණ’’ නමින් පොත් පිංචක් සකස් කිරීම, ‘‘ යහපත් කෘෂිකාර්මික පිළිවෙත් අනුගමනය කිරීම, කාලගුණික විපර්යාස හේතුවෙන් ඇතිවන බලපෑම අවම කිරීමට කටයුතු කිරීම, තේ වගාව සඳහා නව තාක්ෂණය හඳුන්වා දීම ’’ සම්බන්ධයෙන් වීඩියෝ දර්ශන 03ක් සකස් කිරීම හා සුභාරතී ගුවන් විදුලි වැඩසටහන ඔස්සේ තේ වගාකරුවන් දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වා ඇත.

- ශ්‍රී ලංකා තේ මණ්ඩලය හා ස්ටාර් චයිනා ඉන්ටනැෂනල් ට්‍රේඩ් කම්පැනි ලිමිටඩ් (Starchina International Trade Co.Ltd, Fujian Province, China) අතර " Ceylon Tea Online or Offline platform in China " සඳහා අමාත්‍යාංශයේ උපදෙස් මත අවබෝධතා ගිවිසුමක් අත්සන් කර ඇත. එම අවබෝධතා ගිවිසුමට අනුව මාර්ගගත ක්‍රමය ඔස්සේ අලෙවි කටයුතු සිදු කිරීම සඳහා ආයතන 08 ක් ලියාපදිංචි වී ඇති අතර ගිවිසුමට අනුව කටයුතු සිදු කරමින් පවතී.

- සිලෝන් තේ සඳහා භූගෝලීය දර්ශකයක් ලබා ගැනීම සඳහා මූල්‍ය හා තාක්ෂණික සහය ලබා දීමට Agence Francaisa de Development, Center de Cooperartion International en Research Agroromique pour le Development සහ ශ්‍රී ලංකා තේ මණ්ඩලය අතර අමාතයංශයේ උපදෙස් මත ත්‍රෙපාර්ශවික ගිවිසුමක් 2021.12.07 දින අත්සන් කරන ලද අතර මාස 42 ක් ඇතුළත එම කටයුතු අවසන් කිරීමට අපේක්ෂිතය.

- 1975 අංක 14 දරන ශ්‍රී ලංකා තේ මණ්ඩල පනත, 1957 අංක 51 දරන තේ පාලන පනත, 1979 අංක 9 දරන නිෂ්පාදන ද්‍රව්‍ය තැරැව්කරුවන්ට බලපත්‍ර දීමේ පනත සංශෝධනය කිරීමට අවශ්‍ය කටයුතු සිදු කර ඇත.

- තේ වගා සංවර්ධනය සඳහා ගතවන කාලය අඩු කිරීම, තේ අභිජනන වැඩසටහන වේගවත් කිරීම සඳහා නව අණුක ජීව විද්‍යාත්මක ක්‍රමවේදයන් සකස් කිරීම සඳහා ශ්‍රී ලංකාවේ තේ පර්යේෂණ ආයතනය සහ ඉන්දියාවේ හිමාලයානු ජෛව සම්පත් තාක්ෂණ ආයතනය (IHBT) අතර අවබෝධතා ගිවිසුමක් අමාත්‍යාංශයේ උපදෙස් අනුව 2021.02.24 දින අත්සන් කර ඇති අතර ඒ අනුව ඉදිරි කටයුතු සිදු කරමින් පවතී.

රබර් ක්ෂේත්‍රය

- ශ්‍රී ලංකාවේ රබර් වගාව හා ඒ ආශ්‍රිත කර්මාන්ත සංවර්ධනය සඳහා පිහිටුවන ලද කමිටුව මඟින් පහත තීරණ සහ ක්‍රියාමාර්ග ගනු ලැබීය.

  රබර් වැවිලි සමාගම්, කුඩා රබර් වතු අංශය, රබර් නිෂ්පාදන අපනයනකරුවන් ඇතුළු රාජ්‍ය හා රාජ්‍ය නොවන සියලුම අංශ නියෝජිතයන් එකම සාකච්ඡාවකට කැඳවීම තුළින් දීර්ඝ කාලයක් තිස්සේ මහඟරී තිබූ රබර් කර්මාන්තය මුහුණ දී තිබෙන ගැටලු නිරාකරණයට ඉඩ ප්‍රස්ථාව විවර කරලීම.

  ඒ අනුව 2021 වසරේදී කමිටුව රැස්වී මූලික වශයෙන් පැවැති රසායනික පොහොර ගැටලුව, රබර් කර්මාන්තයේ නිෂ්පාදනය ඉහළ නැංවීමට ගත යුතු ක්‍රියාමාර්ග, වගාව වර්ධනය, රබර් අපනයන ආදායම ඉහළ නැංවීම සම්බන්ධව සහ රබර් වගාවට බලපා තිබෙන Pestalotipsis

රෝගය වැළැක්වීම සඳහා ගත යුතු ක්‍රියාමාර්ග ආදී ගැටලු සඳහා විසඳුම් ලබා ගැනීමට අමාත්‍යාංශයේ මැදිහත්වීම ලබා දීම.

- රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව සහ වැවිලි සමාගම් අතර සමීප සම්බන්ධීකරණයක් පවත්වා ගෙනයමින් නිරන්තරයෙන් සාකච්ඡා පැවැත්වීම තුළින් රබර් කර්මාන්තයට අදාළ සංඛ්‍යා ලේඛන දත්ත යාවත්කාලීන කරනු ලැබීය.

- රබර් නව වගාව, නැවත වගාව, වැහි ආවරණ යෙදීම, පැළ නිෂ්පාදනය, දුම් ගෙවල් සෑදීම ආදියෙහි ප්‍රගති සමාලෝචනයන් සිදු කිරීම මඟින් රබර් ක්ෂේත්‍රයේ ආයතනවල කාර්යක්ෂමතාවය වර්ධනයට අවශ්‍ය මඟපෙන්වීම සිදු කර ඇත.

- දේශීය වශයෙන් රබර් ක්ෂේත්‍රයට සම්බන්ධ සියලුම රාජ්‍ය හා පෞද්ගලික ආයතන ඒකාබද්ධ කරමින් යාන්ත්‍රණයක් සකස් කිරීම තුළින් ශ්‍රී ලංකාවේ සමස්ත රබර් කර්මාන්තයේම කාලීනව පැන නඟිනු ලබන ගැටලු සාකච්ඡා කර නිරාකරණය කර ගැනීම සඳහා අවශ්‍ය පසුබිම සකස් කරන ලදී.

- පොහොර අවශ්‍යතාවය ගණනය කිරීම් කඩිනම් කර, රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව මඟින් වගාවට අවශ්‍ය පොහොර, ගොවීන්ට ලබා දීමට කටයුතු කිරීම. එසේම, කාබනික පොහොර භාවිතය සම්බන්ධව පර්යේෂණ දත්ත පදනම් කරගනිමින් රබර් වගාව සඳහා සුදුසු නිර්දේශිත මිශ්‍රණයන් සහ ඊට අදාළ ප්‍රමිතීන් සකස් කරන ලදී.

- කුඩා රබර් වතු හිමියන් 6,000ගේ ක්‍රියාත්මක ධාරිතාවය ඉහළ නැංවීමට (Capacity Building Program for 6,000 Rubber Small holders ; RIVER) ප්‍රංශ රජයේ මූල්‍ය ප්‍රතිපාදන යටතේ ක්‍රියාත්මක කිරීමට යෝජිත මෙම ව්‍යාපෘතිය සඳහා වන මූලික සාකච්ඡාවන් පවත්වන ලදී.

පොල් ක්ෂේත්‍රය

- පොල් ක්ෂේත්‍රය කලමණාකරණය සඳහා පරිපාලන හා නියාමන රාමුවක් ස්ථාපිත කරනු ලැබීය.

- අංක 1623/11 සහ 2009/10/14 දිනැති ගැසට් පත්‍රයේ අංක 11 නියෝගයට අනුව වැලිගම රෝගය ව්‍යාප්ත වී ඇති ප්‍රදේශ අතුරින් සාර්ථක ලෙස රෝගය මර්දනය කර ඇති බව ස්ථිර කරන ලද ග්‍රාම නිලධාරී කොට්ඨාශ 217ක එම රෝගය තවදුරටත් නොපවතින බව මහජනතාවට දැනුම් දීමට නිර්දේශය ලබා දෙන ලදී.

2021 වර්ෂයේ අනුමත කැබිනට් තීරණ



2022 වර්ෂයේ වැවිලි ක්ෂේත්‍රයේ අභිවෘද්ධිය වෙනුවෙන් සිදුකිරීමට යෝජිත විශේෂ ක්‍රියාකාරකම්

තේ ක්ෂේත්‍රය

- තේ කර්මාන්තය මුහුණ දී ඇති අභියෝග ජය ගැනීම සඳහා සකස් කරන ලද පස් අවුරුදු උපායමාර්ගික සැලැස්මට අනුව කටයුතු කිරීම.
- 1957 අංක 51 දරන තේ පාලන පනත සංශෝධනය කිරීමට අවශ්‍ය ඉදිරි කටයුතු සිදුකිරීම.
- ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනය සහ ජපානයේ සයිටාමා විශ්ව විද්‍යාලයේ විද්‍යා හා ඉංජිනේරු උපාධි පාසල (Graduate School of Science and Engineering at Saitama University, Japan) අතර පර්යේෂණ කාර්ය මණ්ඩල සාමාජිකයින් හුවමාරු කර ගැනීම, ආයතනික පර්යේෂණ ව්‍යාපෘති හා අධ්‍යාපන වැඩසටහන් සැලසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීම, අධ්‍යයන ද්‍රව්‍ය හුවමාරු කර ගැනීම සඳහා අවබෝධතා ගිවිසුමක් අත්සන් කිරීම.

- ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනය සහ චීනයේ ෆුජියන් කෘෂිකර්මාන්තය සහ වන විද්‍යා විශ්ව විද්‍යාලය (Fujian Agriculture and Forestry University, China) අතර ෆුජියන් සහ ශ්‍රී ලංකාව අතර සහයෝගීතාව ශක්තිමත් කිරීම සඳහා තේ නිෂ්පාදන හා සැකසුම් තාක්ෂණය සම්බන්ධයෙන් අවබෝධතා ගිවිසුමක් අත්සන් කිරීම.

- තේ පළිබෝධ හා රෝග පාලනය කිරීම සඳහා නැනෝ පළිබෝධනාශක සකස් කිරීම පිළිබඳ ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනය සහ ශ්‍රී ලංකා නැනෝ තාක්ෂණ ආයතනය (පුද්ගලික) සමාගම (SLINTEC) අතර අවබෝධතා ගිවිසුම් අත්සන් කිරීම.

- නවීන තාක්ෂණය, මානව සම්පත , පරීක්ෂණ කටයුතු සහ අනෙකුත් යටිතල පහසුකම් ආයතන දෙක අතර හුවමාරු කර ගැනීමේ අන්‍යෝන්‍ය වශයෙන් වාසිදායක රාමුවක් සහතික කිරීම සඳහා ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනය සහ ආතර් සී. ක්ලාක් ආයතනය (Arthur C. Clark Institute) සමඟ අවබෝධතා ගිවිසුම් අත්සන් කිරීම.

- ජංගම දුරකථනය හරහා තේ වගාව පිළිබඳ තාක්ෂණික තොරතුරු සිත් ගන්නා සුළු සහ කාර්යක්ෂමව ගොවීන් වෙත ලබා දීම සඳහා තේ පර්යේෂණ ආයතනය සහ ඩයලොග් ආසියාටා පී. එල්. සී. (Dialog Axiata PLC) අතර අවබෝධතා ගිවිසුමක් අත්සන් කිරීම.

- කුරුඳු එක්කරන ලද තේ දියවැඩියා රෝගීන් සඳහා සායනික අත්හදා බැලීමට ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනය සහ පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ වෛද්‍ය පීඨය සමඟ අවබෝධතා ගිවිසුමක් අත්සන් කිරීම.

රබර් ක්ෂේත්‍රය

- රබර් ක්ෂේත්‍රයට අදාළව සකස් කරන ලද 2022 වර්ෂයට අදාළ උපායමාර්ගික සැලැස්මට අනුව කටයුතු කිරීම.

- රබර් නව වගාව සහ රබර් නැවත වගාව සඳහා වන සහනාධාර වාරික මුදල ඉහළ නැංවීම සඳහා වන යෝජනාවට අනුව, නැවත වගාව සඳහා රු. 630,000/-ක් සහ නව වගාව සඳහා රු.500,000/- වශයෙන් සහනාධාර මුදල ඉහළ නැංවීම සම්බන්ධව අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව සකස් කිරීම සහ අමාතය මණ්ඩල අනුමැතිය ලබා ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම.

- අමාත්‍යාංශයේ විෂය පථයට අදාළ රාජ්‍ය තාන්ත්‍රික මට්ටමින් ඇති කර ගත් ගිවිසුම් ක්‍රියාත්මක කිරීම සහ ජාත්‍යන්තර සබඳතා සම්බන්ධීකරණය කිරීම.

- ග්‍රාමීය කුඩා රබර් වතු හිමියන්ගේ දැනුම, කාර්යසාධනය සහ ජීවනෝපාය වැඩිදියුණු කිරීමට නියමිත ප්‍රංශ රජයේ මූල්‍යාධාර ඇතිව ක්‍රියාත්මක කිරීමට යෝජිත කුඩා රබර් වතු හිමියන් 6,000කගේ ධාරිතාවය ඉහළ නැංවීමේ (RIVER Project) ව්‍යාපෘතියට අදාළ අවබෝධතා

ගිවිසුම අත්සන් කිරීම, ව්‍යාපෘතියේ මූලික අධ්‍යයනයන් සිදු කිරීම සහ නියමු වැඩසටහන් හා ප්‍රායෝගික තාක්ෂණික පුහුණු සැසි ආරම්භ කිරීම.

- ශ්‍රී ලංකාවේ රබර් වගාව සහ ඒ ආශ්‍රිත කර්මාන්ත සංවර්ධන කමිටුවේ සාකච්ඡාවන් පවත්වා ක්ෂේත්‍රයේ පවතින කාලීන ගැටලු සඳහා අවශ්‍ය විසඳුම් ලබා දීමට අදාළ ආයතන හා නිලධාරීන් යොමු කිරීම.

- දිස්ත්‍රික් වශයෙන් අධීක්ෂණ කමිටු පිහිටුවීම මඟින් ක්ෂේත්‍රයේ බිම් මට්ටමේ පවතින අභියෝග හඳුනා ගැනීම සහ වගකිවයුතු පාර්ශවයන්ගේ අවධානය යොමු කිරීමට කටයුතු කිරීම.

- රබර් සඳහා තිරසාර මිලකරණ යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීම පිළිබඳ ANRPC හි යෝජනාව සඳහා දේශීය වශයෙන් ගත යුතු ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කිරීම.

- වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව සතු ඉඩම්වල රබර් වගාව සිදු කිරීම සඳහා ඉඩම් අත්පත් කර ගැනීම සඳහා අවශ්‍ය පාර්ශව සමඟ මූලික සාකච්ඡාවන් පැවැත්වීම සහ ඒ සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම.

පොල් ක්ෂේත්‍රය

- පොල් සංවර්ධන අධිකාරිය, පොල් වගාකිරීමේ මණ්ඩලය හා පොල් පර්යේෂණ ආයතනය යන අමාත්‍යාංශයට අනුබද්ධ ආයතන ස්ථාපිත කොට ඇති 1971 අංක 46 දරණ පොල් සංවර්ධන පනත සංශෝධනය කිරීමට අදාළ මූලික කටයුතු සිදු කිරීම.

- පොල් ක්ෂේත්‍රයේ පවතින ගැටළු හඳුනාගනිමින් ඒවා සඳහා අවසන් විසඳුම් ලබාගැනීම හා එමගින් රටේ පොල් ඵලදාව වැඩි කරගැනීම සඳහා කටයුතු කිරීම.

- අමාත්‍යාංශයේ විෂය පථයට අදාළ ගිවිසුම් සහ ජාත්‍යන්තර සබඳතා පිළිබඳ සම්බන්ධීකරණ කටයුතු ඉටු කිරීම.



අමාත්‍යාංශයීය අංශ අනුව කාර්යසාධනය

සැලසුම් අංශය

❖ **ව්‍යාපෘති යෝජනා ජාතික ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තුව වෙත යොමු කිරීම.**

- වැවිලි ක්ෂේත්‍රයේ සංවර්ධනය හා ඵලදායීතාවය ඉහළ නැංවීමට අදාළ ව්‍යාපෘති යෝජනා 03ක් නිර්දේශයට යොමු කරන ලදි.

❖ **වෙන්දේසි මිල ගණන් පිළිබඳ සමාලෝචන වාර්තා සැකසීම**

- තේ,පොල්, රබර්, කුරුඳු හා ගම්මිරිස් හි වෙන්දේසි මිල ගණන් ඇතුළත් වාර්තාවක් සතිපතා සකසා ඉදිරිපත් කිරීම.

❖ **ප්‍රගති වාර්තා ඉදිරිපත් කිරීම**

- ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ ආකෘතියට අනුව මාසික හා කාර්තුමය ප්‍රගති වාර්තා සකසා යොමු කිරීම.
- බාහිර අමාත්‍යාංශ හා ආයතනයන්ට වැවිලි ක්ෂේත්‍රයේ ව්‍යාපෘතීන් හි ප්‍රගතිය වාර්තා කිරීම.
- ශ්‍රී ලංකා මහ බැංකුව වෙත වැවිලි ක්ෂේත්‍රයේ කාර්යසාධනය සහ වර්ෂය තුළ ගනු ලැබූ ප්‍රතිපත්තිමය තීරණයන් පිළිබඳ වාර්ෂික, අර්ධ වාර්ෂිකව තොරතුරු හා දත්ත වාර්තා කිරීම.
- ජන හා සංඛ්‍යා ලේඛණ දෙපාර්තමේන්තුව වෙත වැවිලි ක්ෂේත්‍රයට අදාළ වාර්ෂික දත්ත සැපයීම.

❖ **අමාත්‍යාංශයීය ප්‍රකාශන සැකසීම**

- අමාත්‍යාංශයීය කාර්යසාධන වාර්තාව - 2020
- අයවැය විවාදය සඳහා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතු අමාත්‍යාංශයීය ප්‍රගති වාර්තාව 2021

❖ **ක්‍රියාත්මක සැලසුම් සැකසීම**

- අමාත්‍යාංශයීය ක්‍රියාත්මක සැලැස්ම 2021 සැකසීම හා සංශෝධිත ක්‍රියාත්මක සැලැස්ම සැකසීම.
- අමාත්‍යාංශය සඳහා සෘජුව ප්‍රතිපාදන ලැබෙන සංවර්ධන ව්‍යාපෘතීන්හි ක්‍රියාත්මක සැලසුම් සැකසීම හා සංශෝධිත ක්‍රියාත්මක සැලසුම් සැකසීම.
- අනුබද්ධ ආයතනයන්හි ක්‍රියාත්මක සැලසුම් සමාලෝචනය හා ක්‍රියාත්මක ප්‍රගතිය පිළිබඳ මෙහෙයුම් කටයුතු සිදුකිරීම.

❖ **විශේෂ සංවර්ධන ව්‍යාපෘති සම්බන්ධීකරණය**

- කුඩා තේ හා රබර් වතු පුනර්ජීවන ව්‍යාපෘතියේ ප්‍රගතිය සමාලෝචනය කිරීම.
- අමාත්‍යාංශයට සෘජුව ප්‍රතිපාදන ලැබෙන ව්‍යාපෘතීන්ට අදාළව 2021 ඇස්තමේන්තු හා අතුරු සම්මත ගිණුමේ ඇස්තමේන්තු ඇගයීම හා ජාතික අයවැය දෙපාර්තමේන්තුව සමඟ සම්බන්ධීකරණය කිරීම.

❖ **සමාලෝචන රැස්වීම්**

- ප්‍රගති සමාලෝචන රැස්වීම් -10
- විශේෂ සංවර්ධන ව්‍යාපෘති පිළිබඳ රැස්වීම් - 01
- වාර්ෂික ක්‍රියාත්මක සැලැස්ම, වෙනත් සමාලෝචන රැස්වීම් - 01

තේ, රබර් සහ පොල් වතු (කැබලි කිරීමේ පාලන) මණ්ඩලය

අයදුම්පත් ලැබීම් සමස්ත සාරාංශය

විස්තරය	සංඛ්‍යාව
ලැබුණු අයදුම්පත්	865
අධ්‍යක්ෂ මණ්ඩල මඟින් අනුමත කරන ලද අයදුම්පත්	701
ප්‍රතික්ෂේප කරන ලද අයදුම්පත්	-
ක්ෂේත්‍ර පරීක්ෂණ/ නීති උපදෙස්/ වාර්තා ලබාගැනීමට තීරණය වූ අයදුම්පත්	5
පැවරීම අනවශ්‍ය බව දන්වන ලද අයදුම්පත් ගණන	12
පනතට අදාල නොවන අයදුම්පත්	14
වාර්තා ලබා ගැනීමට යොමුකර ඇති සහ අසම්පූර්ණ අයදුම්පත්	133

ඉඩමේ ස්වභාවය අනුව

ලැබී ඇති අයදුම්පත් සංඛ්‍යාව	පවරනු ලබන ආකාරය	ඉල්ලුම් කළ ප්‍රමාණය			2021.12.31 දක්වා අනුමැතිය ලබාදුන් ප්‍රමාණය		
		අක්.	රූඩ්.	පර්.	අක්.	රූඩ්.	පර්.
182	තනි ඒකක	2423	2	21.35	2176	1	33.75
149	බැංකු උකස්	5305	0	24.98	3579	1	12.02
534	අනෙකුත් පැවරීම්	8354	3	20	5937	0	0.68
865	**එකතුව**	**16083**	**2**	**26.33**	**11692**	**3**	**6.45**

දිස්ත්‍රික්ක අනුව

දිස්ත්‍රික්කය	ලැබුණු අයදුම්පත් සංඛ්‍යාව
කුරුණෑගල	359
පුත්තලම	252
ගම්පහ	96
ඉහත දිස්ත්‍රික්ක හැර අනෙකුත් සියලුම දිස්ත්‍රික්ක	158
එකතුව	**865**

භෝග අනුව

භෝග වර්ගය	අයදුම්පත් ගණන	භූමි ප්‍රමාණය (ඉල්ලුම් කරන ලද)		
		අක්.	රූඩ්.	පර්.
පොල්	729	10927	1	5.17
රබර්	35	734	0	39.49
තේ	30	3503	2	26.80
වෙනත්	71	918	1	34.87
එකතුව	**865**	**16083**	**2**	**26.33**

වාර්ෂික වාර්තා අනුමත කිරීමේ ප්‍රගතිය 2021.12.31 දිනට

අනු අංකය	ආයතනය	අවසන් වරට පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරන ලද වාර්තාව	වාර්ෂික වාර්තා සකස් කිරීම පිළිබඳ ප්‍රගතිය
01.	ශ්‍රී ලංකා තේ මණ්ඩලය	2019	2020 වර්ෂයේ අවසන් කෙටුම්පත අනුමත කර ශ්‍රී ලංකා තේ මණ්ඩලය වෙත දැනුම් දී ඇත.
02.	තේ පර්යේෂණ ආයතනය	2018	2019 වර්ෂයේ අවසන් කෙටුම්පත අනුමත කර තේ පර්යේෂණ ආයතනය වෙත දැනුම් දී ඇත. 2020 කෙටුම්පත අමාත්‍යාංශයේ අනුමැතිය සඳහා යොමු කර ඇත.
03.	ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව	2016	2017 වර්ෂයේ කෙටුම්පත සංස්ථාවේ අනුමැතිය සඳහා යොමු කර ඇත.

අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක සංවර්ධන ව්‍යාපෘතීන්හී ප්‍රගතිය - 2021

අයවැය ඇස්තමේන්තු මඟින් සෘජුව ප්‍රතිපාදන ලැබෙන ව්‍යාපෘතීන්හී

2021.12.31 දිනට මූල්‍ය හා භෞතික ප්‍රගතිය

ශ්‍රම ඵලදායීතාවය ඉහළ නැංවීම පිණිස ස්වයංක්‍රියව තේ දළු තෝරා නෙලා ගතහැකි යන්ත්‍ර නිර්මාණය හදුන්වාදීමේ ව්‍යාපෘතිය		
ව්‍යාපෘති කාලය - (2021-2023) ක්‍රියාත්මක ආයතනය - තේ පර්යේෂණ ආයතනය		
භෞතික ප්‍රගතිය	**2021 ඇස්තමේන්තුව (රු.මි.)**	**මූල්‍ය ප්‍රගතිය (රු.මි.)**
❖ යන්ත්‍ර තවදුරටත් වැඩිදියුණු කිරීමට උපදෙස් ලබා දී ඇත. ❖ නව නිපැයුම්කරුවන් කැඳවා ඔවුන් නිර්මාණය කරන ලද මූලාකෘති සවිස්තරාත්මකව පරීක්ෂා කිරීම වැඩිදියුණු කිරීම් සහ වෙන්කිරීම් සඳහා උපදෙස් යෝජනා ලබා දී ඇත . ❖ රත්නපුර තේ පර්යේෂණායතන ක්ෂේත්‍රයේදී තේ දළුවල ඡායරූප අධ්‍යනය සහ එමගින් යන්ත්‍ර දැනුවත් කිරීම (Machine Learning) සිදු කර ඇත. ❖ තෝරාගත් පාර්ශවකරුවන් හා තේ පර්යේෂණායතනය අතර එළඹීමට නියමිත අවබෝධතා ගිවිසුම සනාථ කරන ලදි.	8.35	8.35
❖ සම්මුචිත භෞතික ප්‍රගතිය - 40% ❖ මූල්‍ය ප්‍රගතිය - 100 %		

දේශගුණික වෙනස්වීම්වලට ඔරොත්තු දෙන වැඩිදියුණු කළ බීජ උද්‍යාන ස්ථාපිත කිරීමේ ව්‍යාපෘතිය		
ව්‍යාපෘති කාලය - (2021-2025) ක්‍රියාත්මක ආයතනය - තේ පර්යේෂණ ආයතනය		
භෞතික ප්‍රගතිය	**2021 ඇස්තමේන්තුව (රු.මි.)**	**මූල්‍ය ප්‍රගතිය (රු.මි.)**
❖ ඉඩම් සිතියම්ගත කිරීමට පරිශ්‍ර 15ක් තෝරාගෙන ඇත. ❖ උද්‍යාන 15 සඳහා පැල නිපදවීම අවසන් කර ඇත. ❖ තණකොල කපන යන්ත්‍ර 02ක් මිලදිගෙන ඇත. ❖ නව බීජ උද්‍යාන 01ක් ස්ථාපිත කර ඇත. ❖ බීජ උද්‍යාන 05ක ස්ථාපන කටයුතු ආරම්භ කර ඇත. ❖ තවත් බීජ උද්‍යාන 05ක මූලික බිම් සනාථ කර අවසන් කර ඇත. ❖ බීජ උද්‍යාන 08ක් ඉදිකිරීමට අවබෝධතා ගිවිසුම් අත්සන් කර ඇත.	7.85	7.85
❖ සම්මුචිත භෞතික ප්‍රගතිය - 68% ❖ මූල්‍ය ප්‍රගතිය - 100 %		

ජෛව පළිබෝධනාශක වැඩිදියුණු කිරීම සහ වාණිජ්‍යකරණය අරමුණු කරගනිමින් නිෂ්පාදන පහසුකම් ස්ථාපනය කිරීම		
ව්‍යාපෘති කාලය -(2021-2022) ක්‍රියාත්මක ආයතනය - තේ පර්යේෂණ ආයතනය		
භෞතික ප්‍රගතිය	**2021 ඇස්තමේන්තුව (රු.මි.)**	**මූල්‍ය ප්‍රගතිය (රු.මි.)**
